# පාදෙණිය රජමහා විහාරයේ සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

**දසනායක ඩී.එම්.පී.අයි,[1] හේමචන්ද්‍ර පී.ඩී.ඒ.එස්.[2]**

පාදෙණිය රජමහා විහාරය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාදෙණිය ග්‍රාමයේ පිහිටි ඓතිහාසික විහාරයකි. මූලාශ්‍රගත තොරතුරු අනුව මෙම විහාරය ආරම්භ කර ඇත්තේ ක්‍රි.පූ 3 වැනි සියවසේ දෙවනපෑතිස් රජු දවස අනුරාධපුරයෙන් ගෙන ආ ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් සිටුවීමත් සමඟය. මෙම විහාරයේ බිතු සිතුවම්වල දක්නට ලැබෙන ශෛලිය, සම්ප්‍රදාය සහ ශිල්ප ක්‍රමවල සුවිශේෂීතාවයක් පවතීද යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. විහාර සිතුවම් ආරක්ෂා කරගැනීම උදෙසා බලධාරීන්ගේ අවධානය යොමු කරවීම පර්යේෂණ අරමුණයි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා සබැඳි සිතුවම් පරීක්ෂා කිරීම මත සිදුකරනු ලැබේ. මෙම විහාරයේ බිතු සිතුවම්වලින් මහනුවර යුගයේ ලක්ෂණ මැනෙවින් කැපී පෙනේ. මෙම සිතුවම් අතර හෙල්ලක් වැනි ආයුධයක් අතින් ගත් දේශීය සෙබළෙකුගේ යැයි සිතිය හැකි රූපයක්, කඩුවක් අතින් ගත් සෙබළෙක් සහ කෙටේරියක් කරමත තබා ගෙන සිටින සෙබළෙක් වේ. මොහුගේ යටි කයට අලංකාරවත් ජෝතියක් අන්දවා තිබේ. ඔහුගේ උඩුකයට අන්දවා තිබෙන හැට්ටය අතින් රූපවල දක්නට නොලැබෙන සේ අත දිගට යොදා තිබේ. මීට ඉහළින් බුද්ධ චරිතයේ වැදගත් අවස්ථාවක් වන සත් සතිය දක්වා තිබේ. මෙම තීරු අතර දක්නට ලැබෙන බුදුන් වහන්සේ හයවන සතියේ බෝධි මූලයේ වැඩ සිටින අයුරු දැක්වෙන සිත්තමේ තිබෙන විශේෂත්වය වන්නේ කොළ පැහැ වර්ණය භාවිතා කරමින් බෝධීන් වහන්සේ සිත්තම් කර තිබීමයි. මෙකල ඇඳ ඇති සිතුවම්වල වර්ණ භාවිතය සීමිත වූ අතර කොළ වර්ණය භාවිතා කර ඇත්තේ කලාතුරකිනි. තවද සැරියුත් මහරහතන් වහන්සේ යැයි සිතිය හැකි වළාකුළු මත වැඩ සිටින ඉරියව්වෙන් යුත් සිතුවමක්ද, මුගලන් මහරහතන් වහන්සේගේ යැයි සිතිය හැකි චිත්‍රයක්ද වේ. මෙහි එක් භික්ෂු රූපයන් වැඳගෙන සිටින ඉරියව්වෙන් නිරූපිත වේ. ඉන්පසුව අලංකාරවත් ඇඳුමින් සරසා තිබෙන සමාජයේ උසස් ප්‍රභූවරයෙක් යැයි සිතිය හැකි සිත්තමකි. මහනුවර යුගයේ ප්‍රධාන වශයෙන් වර්ධනය වූ මෙම සිතුවම් සම්ප්‍රදාය එම යුගයේ සිතුවම් ඇසුරින් බිහි වූ සම්ප්‍රදායක් ලෙස හැඳින්විය හැකිය. මෙම සිතුවම් අධ්‍යයනය කිරීමේදී සිත්තම් මත දක්නට ලැබෙන සීමිත වර්ණ භාවිතය, ශෛලීගත ස්වරූපයක් අනුගමනය කිරීම, රේඛාවන් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දීම, පසුබිම හිස්ව නොතිබීම, කෙටි වැකියකින් අවස්ථා පැහැදිලි කරලීම වැනි සුවිශේෂී ලක්ෂණයන් හඳුනාගැනීමට හැකියාව ලැබුණි.

**ප්‍රමුඛ පද :** පාදෙණිය, බිතු, වර්ණ, විහාරය, සිතුවම්

[1,2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ishanipoornima80@gmail.com